# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය පනත

---

[සහතිකය සටහන් කළේ **2005** සැප්තැම්බර් මස **23** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2005 සැප්තැම්බර් මස 23 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු. 16.25 යි. තැපැල් ගාස්තුව : රු. 7.50 යි

# 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය පනත

[සහතිකය සටහන් කළේ 2005 සැප්තැම්බර් මස 23 වන දින]

එල්. ඩී.–ඕ. 60/98.

**අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය පිහිටුවීම සඳහා ද ඒ සම්බන්ධ හා ඊට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

## I වන කොටස

## අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය පිහිටුවීම

**2**. (1) අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු මණ්ඩලයක් (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පිහිටුවනු ලැබිය යුතු ය. මෙම මණ්ඩලය, ශ්‍රී ලංකාව සඳහා වන ජාතික ප්‍රතීතන අධිකාරිය විය යුතු ය. අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය පිහිටුවීම.

(2) මණ්ඩලය (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, මණ්ඩලය විසින් එහි සංස්ථා නාමයෙන් නඩු පැවරීම ද, මණ්ඩලයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද, කරනු ලැබිය හැකි ය.

**3**. මණ්ඩලයේ කර්තව්‍ය විය යුත්තේ– මණ්ඩලයේ කර්තව්‍ය.

(අ) අදාළ ජාත්‍යන්තර ප්‍රමිති මත පදනම් වූ ජාතික ප්‍රමිතිවලට අනුකූලව, පරීක්ෂණාගාරවලට, සහතිකකරණ සහ පරීක්ෂණ ආයතනවලට, පුහුණුකිරීමේ ආයතනවලට සහ අනුකූලතා තක්සේරු කරගෙන යාමට නියමිත වෙනත් තැනැත්තන්ට ප්‍රතීතන ප්‍රදානය කිරීම ;

(ආ) ජාතික තත්ත්ව ප්‍රතිපත්තියේ නියම කරනු ලැබූ, කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ ඇති පරිදි වූ නියමු උපදේශවලට අනුකූලව ප්‍රතීතන කටයුතු ප්‍රවර්ධනය කිරීම ;

(ඇ) ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රතීතන ව්‍යවහාරයන්හි නිපුණතාවය සාක්ෂාත් කර ගැනීම සහ ප්‍රතීතනයේ දී ජාත්‍යන්තර සහයෝගිතාවය සඳහා පහසුකම් සැලසීම ;

(ඈ) ප්‍රතීතන භාවිතය දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම, තක්සේරුකරුවන් පුහුණු කිරීම, වැඩමුළු පැවැත්වීම සහ ප්‍රතීතනය පිළිබඳව තොරතුරු ප්‍රචාරණය කිරීම ;

(ඉ) විදේශීය සහ ජාත්‍යන්තර මණ්ඩල සමග, ප්‍රතීතනයට අදාළ හෝ සම්බන්ධ කාරණා සම්බන්ධයෙන්, අන්‍යොන්‍ය පිළිගැනීම මත ගිවිසුම් ඇතිකර ගැනීම ; සහ

(ඊ) ඉහත දක්වන ලද ඕනෑම කර්තව්‍යයක් හෝ සියලුම කර්තව්‍යයන් ඉටුකිරීමේ දී අවශ්‍ය නම් සුදුසු යයි හැඟෙන වෙනත් ඕනෑම ක්‍රියාවක් ක්‍රියාවට නැංවීම.

මණ්ඩලයේ බලතල.

**4**. පහත දැක්වෙන බලතල සියල්ල හෝ බලතල කිසිවක් මණ්ඩලය සතුවිය යුතු අතර, එම බලතල මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය :—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ආ) මණ්ඩලයේ කර්තව්‍ය ඉටුකිරීමේ ලා හිතකර බවට, මණ්ඩලයට පෙනී යන කිසියම් භාරයක් හෝ නියෝජ්‍යායතන ව්‍යාපාර කටයුත්තක් ක්‍රියාවෙහි යෙදවීම භාර ගැනීම ;

(ඇ) මණ්ඩලයේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා ණය ලබාගැනීම සහ එම ණය ලබාගැනීමේ කාර්යය සඳහා මණ්ඩලය අවශ්‍ය යයි සලකනු ලබන පරිදි මණ්ඩලයට අයිති දේපළ උකස් කිරීම හෝ ඇප වශයෙන් තැබීම ;

(ඈ) මණ්ඩලයේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා වහා අවශ්‍ය නොවන මණ්ඩලයේ මුදල් කිසිවක් මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයකින් ආයෝජනය කිරීම ;

(ඉ) මණ්ඩලය විසින් සලසනු ලබන යම් සේවා සඳහා මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි ගාස්තු අයකිරීම ;

(ඊ) එහි කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් ගිවිසුම්වලට ඇතුළත් වීම ;

(උ) මණ්ඩලයේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය හෝ ආනුෂංගික වූ හෝ හිතකර වූ වෙනත් සියලු කටයුතු කිරීම.

පාලක සභාව.

**5**. (1) මණ්ඩලය අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයින් දහතුන් දෙනකු අඩංගු පාලක සභාවකින් සමන්විත විය යුතු අතර, ඒ සාමාජිකයන් අතුරෙන්,–

(අ) සාමාජිකයන් තිදෙනෙකු විද්‍යා, තාක්ෂණ, අධ්‍යාපන, වෙළෙඳ, කාර්මික හෝ පරිපාලන හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රවල දක්ෂතා පෙන්නුම් කර ඇති තැනැත්තන් විය යුතු ය ;

(ආ) එක් සාමාජිකයකු, 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනතින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නියෝජිතවරයා වන්නා වූ ද ඒ ආයතනයේ සභාපතිවරයා විසින් නම් කරනු ලැබිය යුතු වූ ද තැනැත්තකු විය යුතු ය ;

(ඇ) එක් සාමාජිකයකු, විද්‍යා හා තාක්ෂණික විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ සහ ඒ අමාත්‍යවරයා වෙත පවරනු ලැබ ඇති දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල නියෝජිතවරයා වන්නා වූ ද, ඒ අමාත්‍යවරයා විමසා පත්කරනු ලැබිය යුතු වූ ද තැනැත්තකු විය යුතු ය ;

(ඈ) එක් සාමාජිකයකු, මහා භාණ්ඩාගාරයේ නියෝජිතවරයා වන්නා වූ ද මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා පත්කරනු ලැබිය යුතු වූ ද තැනැත්තකු විය යුතු ය ;

(ඉ) එක් සාමාජිකයකු, වෙළෙඳ කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ සහ ඒ අමාත්‍යවරයා වෙත පවරනු ලැබ ඇති දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල නියෝජිතවරයා වන්නා වූ ද, ඒ අමාත්‍යවරයා විමසා පත් කරනු ලැබිය යුතු වූ ද තැනැත්තකු විය යුතු ය;

(ඊ) එක් සාමාජිකයකු, කර්මාන්ත සංවර්ධන කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ සහ ඒ අමාත්‍යවරයා වෙත පවරනු ලැබ ඇති දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල නියෝජිතවරයා වන්නා වූ ද, ඒ අමාත්‍යවරයා විමසා පත් කරනු ලැබිය යුතු වූ ද තැනැත්තකු විය යුතු ය ;

(උ) එක් සාමාජිකයකු, සෞඛ්‍ය විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ සහ ඒ අමාත්‍යාංශය වෙත පවරනු ලැබ ඇති දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල නියෝජිතවරයා වන්නා වූ ද, ඒ අමාත්‍යවරයා විමසා පත් කරනු ලැබිය යුතු වූ ද තැනැත්තකු විය යුතු ය ;

(ඌ) එක් සාමාජිකයකු, මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තු භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතවරයා වන්නා වූ ද, ඒ අමාත්‍යවරයා විමසා පත් කරනු ලැබිය යුතු වූ ද තැනැත්තකු විය යුතු ය ;

(එ) එක් සාමාජිකයකු, කෘෂිකර්මය විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ හා ඒ අමාත්‍යවරයා වෙත පවරනු ලැබ ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථා මණ්ඩලවල නියෝජිතවරයා වන්නා වූ ද, ඒ අමාත්‍යවරයා විමසා පත් කරනු ලැබිය යුතු වූ ද, තැනැත්තකු විය යුතු ය ;

(ඒ) එක් සාමාජිකයකු, ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභාව විසින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ නම් තුනකින් යුත් මූල මණ්ඩලයකින් අමාත්‍යවරයා විසින් තෝරා ගනු ලැබූ තැනැත්තකු විය යුතු ය ; සහ

(ඔ) එක් සාමාජිකයකු, වාණිජ හා කර්මාන්ත සංගමය විසින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ නම් තුනකින් යුත් මූල මණ්ඩලයකින් අමාත්‍යවරයා විසින් තෝරා ගනු ලැබූ තැනැත්තකු විය යුතු ය.

(2) පාලක සභාවේ සාමාජිකයකු රෝගාතුරවීමෙන්, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමෙන් හෝ වෙනත් අන් හේතුවක් නිසා, තාවකාලිකව මාස තුනකට වැඩි කාලයක් ස්වකීය ධුරයේ කාර්යය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින්, සභාපතිවරයාගේ නිර්දේශ මත හා (1) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන, ඔහු වෙනුවට වැඩ බැලීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත්කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම ද මණ්ඩලයේ කටයුතු පිළිබඳ මූලික අධීක්ෂණය, මෙහෙයවීම සහ කළමනාකරණය ද පාලක සභාව වෙත පැවරිය යුතු ය.

පාලක සභාපති හා උප සභාපති.

**6**. (1) පාලක සභාවේ සභාපති වශයෙන් අධ්‍යක්ෂවරයා හැර පාලක සභාවේ වෙනත් සාමාජිකයකු අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය යුතු ය.

(2) පාලක සභාවේ රැස්වීම්වල මූලාසනය දැරීම සහ එහි ක්‍රියාකාරකම් වල දී පාලක සභාව මෙහෙයවීම සභාපතිවරයාගේ කර්තව්‍ය විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් පාලක සභාවේ වෙනත් සාමාජිකයකු පාලක සභාවේ උපසභාපතිවරයා ලෙස පත්කරනු ලැබිය යුතු ය. සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක දී හෝ සභාපතිවරයාගේ ධුරය හිස්ව පවතින අවස්ථාවක දී උපසභාපතිවරයා විසින් සභාපතිවරයාගේ ධුරයේ කටයුතු කළ යුතු ය.

පාලක සභාවේ සාමාජිකයකු වීමෙහි ලා නුසුදුසුවීම.

**7**. යම් තැනැත්තකු—

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් ; හෝ

(ආ) මණ්ඩලය විසින් හෝ එය වෙනුවෙන් ඇතිකරගත් යම් ගිවිසුමක් යටතේ කෙලින්ම හෝ වක්‍රාකාරයකින්, තමා විසින් හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින්, යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් දරන්නේ නම් හෝ භුක්ති විඳින්නේ නම් ; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට, තීරණය කරනු ලැබ ඇත්නම් හෝ ප්‍රකාශයට පත්කරනු ලැබ ඇත්නම් ; හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ බුන්වත් හෝ බංකොලොත් තැනැත්තකු බවට ප්‍රකාශයට පත් කරනු ලැබ බුන්වත් භාවයෙන් හෝ බංකොලොත් භාවයෙන් නිදහස් කරනු ලැබ නොමැතිනම් ; හෝ

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් යම් වරදකට වරදකරු කරනු ලැබ ඇති තැනැත්තකු නම්,

ඒ තැනැත්තා, පාලක සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

පාලක සභාවේ සාමාජිකයන්ගේ ධුරකාලය.

8. (1) පාලක සභාවේ යම් සාමාජිකයකු විසින් තත්කාර්යය සඳහා අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි වන්නේ ය.

(2) අමාත්‍යවරයා විසින් පාලක සභාවේ යම් සාමාජිකයකු හේතු දක්වා, ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, පාලක සභාවේ සාමාජිකයකුගේ ධුර කාලය අවුරුදු තුනක් විය යුතු ය :

එසේ වුවද, මිය ගිය, ධුරයෙන් ඉල්ලා අස් වූ හෝ ඉවත් කරනු ලැබූ සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන සභාවේ සාමාජිකයකු, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉතිරි කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(4) පාලක සභාවේ සභාපතිවරයා සහ උපසභාපතිවරයා විසින් තත්කාර්යය සඳහා අමාත්‍යවරයා අමතන ලිපියක් මගින් පිළිවෙලින් පාලක සභාවේ සභාපති සහ උපසභාපති ධුරවලින් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් එකී ලිපි භාරගනු ලැබූ දින සිට බලාත්මක වන්නේ ය.

(5) අමාත්‍යවරයා විසින් තත්කාර්යය ගැන හේතු දක්වා පාලක සභාවේ සභාපතිවරයා සහ උපසභාපතිවරයා පිළිවෙලින් පාලක සභාවේ සභාපති සහ උපසභාපති ධුරවලින් ඉවත් කරනු ලැබිය හැක.

(6) (4) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව පාලක සභාවේ සභාපතිවරයාගේ සහ උපසභාපතිවරයාගේ ධුරකාලය පාලක සභාවේ ඔවුන්ගේ සාමාජිකත්වය බලපවත්වන කාලසීමාව විය යුතු ය.

නැවත පත්කිරීමේ සුදුසුකම්.

**9**. කාලය ඉකුත්වීමේ හේතුවෙන් ධුරය අත්හරිනු ලබන පාලක සභාවේ යම් සාමාජිකයකු, නැවත පත් කිරීම සඳහා සුදුස්සකු විය යුතු ය.

පාලක සභාවේ සාමාජිකයින්ගේ පාරිශ්‍රමික.

**10**. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි වූ පාරිශ්‍රමික සියලු සාමාජිකයන්ට මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

පාලක සභාවේ රැස්වීම්.

**11**. (1) පාලක සභාවේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් පස්දෙනකු විය යුතු ය.

(2) පාලක සභාවේ සාමාජිකයන් අවම වශයෙන් පස්දෙනකුවත් ශ්‍රී ලංකාවේ සිටී නම්, යම් ප්‍රශ්නයක් පිළිබඳව ශ්‍රී ලංකාවේ සිටින සාමාජිකයන් අතර අදාළ ලියකියවිලි බෙදාහැරීමෙන් සහ එම සාමාජිකයන් විසින් එම ප්‍රශ්නය පිළිබඳව තම අදහස් ලිඛිතව වාර්තා කිරීමෙන් සහ ඔවුන්ගේ ඡන්දය ප්‍රකාශ කිරීමෙන් එම ප්‍රශ්නය විසඳා ගනු ලැබිය හැකි අතර, එවැනි සෑම අවස්ථාවක දී ම එම ප්‍රශ්නය, ඒ පිළිබඳ අදහස් සහ ඡන්ද පිළිබඳ වාර්තාවක් පාලක සභාවේ වාර්තා පොතේ වාර්තා ගත කළ යුතු ය. එම ඡන්දවල සමාන තත්ත්වයක් ඇත්නම් එම ප්‍රශ්නය තීරණයක් ගැනීම සඳහා පාලක සභාවේ රැස්වීමකට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ අනිකුත් විධිවිධානවලට යටත්ව, පාලක සභාවේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය පාලක සභාව විසින් විධිමත් කරගනු ලැබිය හැකි ය.

(4) පාලක සභාවේ යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමේ ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක්, පාලක සභාවේ යම් ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් නිර්බල වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

12. (1) (2) වන උපවගන්තියේ සඳහන් සාධන පත්‍රයක් හැර මණ්ඩලයේ යම් සාධන පත්‍රයකට මුද්‍රාව තැබීම—

මුද්‍රාව.

(අ) පාලක සභාවේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂවරයා ; හෝ

(ආ) පාලක සභාවේ සභාපතිවරයා හෝ අධ්‍යක්ෂවරයා සහ පාලක සභාවේ වෙනත් යම් සාමාජිකයකු ; හෝ

(ඇ) අධ්‍යක්ෂවරයා සහ පාලක සභාව වෙනුවෙන් ක්‍රියා කිරීමට පාලක සභාව විසින් විශේෂයෙන් බලය දී ඇති මණ්ඩලයේ යම් නිලධරයකු හෝ සේවකයකු,

ඉදිරියේ දී කළ යුතු අතර, ඒ දෙදෙනා ඒ සාධන පත්‍රයට තම අත්සන් තබනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලය විසින් යම් සේවාවක් සැලසීම සඳහා වන ගිවිසුමක් ඇතුළත් සාධන පත්‍රයකට මණ්ඩලයේ මුද්‍රාව තැබීම අධ්‍යක්ෂකවරයා හෝ ඔහු පැමිණ නොසිටින විට මණ්ඩලය වෙනුවෙන් ක්‍රියා කිරීම පිණිස පාලක සභාව විසින් විශේෂයෙන් බලය දෙන ලද එහි යම් නිලධරයකු හෝ සේවකයකු ඉදිරිපිට විය යුතු අතර, අධ්‍යක්ෂවරයා හෝ ඒ නිලධරයා හෝ සේවකයා විසින් සහතික කරනු ලැබිය යුතු ය.

13. (1) ස්වකීය බලතල සහ කාර්ය වලින් කිසිවක් පාලක සභාව විසින් මණ්ඩලයේ අධ්‍යක්ෂවරයාට, පාලක සභාවේ සාමාජිකයකුට හෝ මෙම පනත යටතේ පත්කළ යම් කමිටුවකට හෝ මණ්ඩලයේ යම් නිලධරයකුට හෝ සේවකයකුට පවරනු ලැබිය හැකි ය.

බලතල සහ කාර්යය පවරාදීම.

(2) (1) වන උපවගන්තිය යටතේ පාලක සභාව විසින් බලතල පවරනු ලැබූ අධ්‍යක්ෂවරයා, පාලක සභාවේ සාමාජිකයා, මණ්ඩලයේ නිලධරයා, සේවකයා හෝ කමිටුව විසින්, එසේ පවරන ලද බලතල හෝ කාර්යය, පාලක සභාවේ විශේෂ හෝ සාමාන්‍ය විධානවලට යටත්ව, ඉටුකිරීම හෝ ක්‍රියාත්මක කිරීම කරනු ලැබිය යුතු ය.

14. (1) මණ්ඩලයේ කාර්යය ඉටුකිරීමේ දී එයට සහායවීම සඳහා කමිටුවේ සාමාජිකයන් වීමට සුදුසු යයි පාලක සභාව විසින් සලකනු ලබන තැනැත්තන්ගෙන් (මණ්ඩලයේ නිලධරයන් හෝ සේවකයන් වන හෝ නොවන) සමන්විත කමිටු පාලක සභාව විසින් පත්කරනු ලැබිය හැකි ය.

කමිටු පත් කිරීම.

(2) පාලක සභාව විසින් සුදුසු යයි සලකනු ලබන පාලක සභාවේ බලතල කිසිවක් එසේ පත්කරනු ලැබූ කමිටුවක් වෙත පාලක සභාව විසින් පවරනු ලැබිය හැකි නමුත් එම පැවරීම නොතකා, පාලක සභාව විසින්, එසේ පවරනු ලැබූ බලතල කිසිවක් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය. එවැනි යම් කමිටුවක් විසින් කරනු ලැබූ යම් තීරණයක් පාලක සභාව විසින් සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව පාලක සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පාරිශ්‍රමික සහ දීමනා එකී සෑම කමිටුවකම සාමාජිකයන්ට මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

## II වන කොටස

## ප්‍රතීතනය

ප්‍රතීතනය සඳහා උපමාන නිශ්චය කිරීම.

**15**. අනුකූලතා තක්සේරු කිරීම සඳහා නියමිත පරීක්ෂණාගාර, සහතිකකරන හෝ පරීක්ෂණ ආයතන, පුහුණු කිරීමේ ආයතන සහ වෙනත් තැනැත්තන් ප්‍රතීතනය කිරීම සඳහා, නිර්නායක සහ නියමයන් නිශ්චිතව සඳහන් කරමින්, අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

ප්‍රතීතනය සඳහා ඉල්ලුම් කිරීම.

**16**. අවස්ථාවෝචිත පරිදි අනුකූලතා තක්සේරු ක්‍රියාත්මක කිරීමට නියමිත පරීක්ෂණාගාරයක හෝ සහතික කරන හෝ පරීක්ෂණ ආයතනයක පරිපාලන නිලධරයා විසින් හෝ ප්‍රධාන විධායක නිලධරයා විසින් හෝ යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ නියමිත පරීක්ෂණ සහ අනෙකුත් ක්‍රියාකාරකම් කරගෙනයාම සඳහා ප්‍රතීතනය ලබා ගැනීම පිණිස, ඒ කාර්ය සඳහා සාදනු ලබන නියෝග වලින් නියම කරනු ලබන ආකාරයට සහ පිළිවෙලට මණ්ඩලය වෙත ඉල්ලුම් කළ යුතු ය.

ප්‍රතීතනය ප්‍රදානය කිරීම.

**17**. මණ්ඩලය විසින්, 16 වන වගන්තිය යටතේ ඉල්ලීම කරනු ලැබ ඇති පරීක්ෂණාගාරය, සහතිකකරන හෝ පරීක්ෂණ ආයතනය, පුහුණු කිරීමේ ආයතනය හෝ තැනැත්තා විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම සලකා බැලීමෙන් පසු, අවශ්‍ය යයි සලකනු ලබන යම් පරීක්ෂණ හා තක්සේරු කටයුතු කිරීමෙන් පසු සහ 14 වන වගන්තිය යටතේ පත් කරන ලද අදාළ කමිටුව විමසීමෙන් ද පසු 15 වන වගන්තිය යටතේ නිශ්චය කරනු ලැබූ ප්‍රතීතනය සඳහා වූ නිර්ණායක සහ නියමයන් ඉල්ලුම්කරු විසින් සපුරා ඇති බවට මණ්ඩලය සෑහීමට පත්වන අවස්ථාවක මණ්ඩලය විසින්, අවස්ථාවෝචිත පරිදි ඒ පරීක්ෂණාගාරය, සහතිකකරන හෝ පරීක්ෂණ ආයතනය, පුහුණු කිරීමේ ආයතනය හෝ තැනැත්තා වෙත ප්‍රතීතනය ප්‍රදානය කරනු ලැබිය යුතු ය.

සහතිකය සහ ප්‍රතීතන ලාංඡනය භාවිතා කිරීම.

**18**. (1) මණ්ඩලය විසින් අනුකූලතා තක්සේරු කර ගෙන යාමට නියමිත පරීක්ෂණාගාරයකට, සහතිකකරන හෝ පරීක්ෂණ ආයතනයකට, පුහුණු කිරීමේ ආයතනයකට හෝ වෙනත් තැනැත්තකුට 17 වන වගන්තිය යටතේ ප්‍රතීතන ප්‍රදානය කරන අවස්ථාවක දී එම පරීක්ෂණාගාරය, සහතිකරන හෝ පරීක්ෂණ ආයතනය, පුහුණු කිරීමේ ආයතනය හෝ තැනැත්තකු විසින් කරගෙන යාමට හෝ ඉටුකිරීමට ප්‍රතීතන ලබන පරීක්ෂණ හෝ වෙනත් ක්‍රියාකාරකම් නිශ්චිතව දක්වමින් අධ්‍යක්ෂවරයා විසින් අත්සන් කරන ලද සහතිකයක් මණ්ඩලය විසින් නිකුත් කළ යුතු අතර නියමිත ප්‍රතීතන ලාංඡනය මෙහි පහත දක්වා ඇති ආකාරයට භාවිත කිරීම සඳහා එම පර්යේෂණාගාරය, සහතික කරන හෝ පරීක්ෂණ ආයතන, පුහුණු කිරීමේ ආයතන හෝ තැනැත්තන්ට අවසර දීම ද කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකය–

(අ) පරීක්ෂණාගාරය තුළ හෝ ;

(ආ) අවස්ථාවෝචිත පරිදි එම සහතිකය නිකුත් කරනු ලැබූ සහතිකකරන හෝ පරීක්ෂණ ආයතනයේ හෝ පුහුණු කිරීමේ ආයතනයේ හෝ තැනැත්තාගේ ව්‍යාපාරික ස්ථානයේ,

ප්‍රකටව ප්‍රදර්ශනය කළ යුතු ය.

(3) (අ) 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ විධිවිධානවලට යටත්ව, 17 වන වගන්තිය යටතේ ප්‍රතීතනය ප්‍රදානය කරනු ලැබූ පරීක්ෂණාගාරයක්, සහතිකකරන හෝ පරීක්ෂණ ආයතනයක්, පුහුණු කිරීමේ ආයතනයක් හෝ තැනැත්තකු හැර වෙනත් තැනැත්තකු විසින් නියමිත ප්‍රතීතන ලාංඡනය භාවිත නොකළ යුතු ය.

(ආ) පරීක්ෂණාගාරයක්, සහතිකකරන හෝ පරීක්ෂණ ආයතනයක්, පුහුණු කිරීමේ ආයතනයක් හෝ තැනැත්තකු විසින් නියමිත ප්‍රතීතන ලාංඡනය පාවිච්චි කළ හැක්කේ 17 වන වගන්තිය යටතේ එයට ප්‍රදානය කරන ලද ප්‍රතීතනය වලංගුව පවතින තාක් කල් පමණක් සහ කරගෙන යාමට සහ ඉටු කිරීමට ප්‍රතීතන ලබා ඇති පරීක්ෂණ සහ වෙනත් නිශ්චිත ක්‍රියාකාරකම්වලට අදාළව පමණකි.

තත්ත්වයෙහි සිදු වී ඇති වෙනස්වීම් සම්බන්ධයෙන් මණ්ඩලය වෙත දැනුම් දීමට ඇති යුතුකම.

**19**. තම තත්ත්වයේ හෝ මෙහෙයුම්වල යම් වෙනසක් සිදුවුවහොත් එම වෙනස සිදු වී ඇති වහාම මණ්ඩලයට දැනුම්දීම 17 වන වගන්තිය යටතේ ප්‍රතීතනය ප්‍රදානය කරනු ලැබුවා වූ පරීක්ෂණාගාරයක හෝ සහතිකකරන හෝ පරීක්ෂණ ආයතනයක, පුහුණු කිරීමේ ආයතනයක හෝ වෙනත් තැනැත්තකුගේ, වගකීම විය යුතු ය.

ප්‍රතීතනය අත්හිටුවීම හා ප්‍රත්‍යාදිෂ්ට කිරීම.

**20**. (1) (අ) 17 වන වගන්තිය යටතේ ප්‍රතීතනය ප්‍රදානය කරනු ලැබුවා වූ යම් පරීක්ෂණාගාරයක්, සහතිකකරන හෝ පරීක්ෂණ ආයතනයක්, පුහුණු කිරීමේ ආයතනයක් හෝ තැනැත්තකු විසින්, ප්‍රතීතනය සඳහා 15 වන වගන්තිය යටතේ නියම කරන ලද නිර්නායක සහ නියමයන් සපුරාලීම තවදුරටත් කරනු නොලබන බවට ; හෝ

(ආ) අවස්ථාවෝචිත පරිදි ඒ පරීක්ෂණාගාරය, සහතිකකරන හෝ පරීක්ෂණ ආයතනය, පුහුණු කිරීමේ ආයතනය හෝ තැනැත්තා සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ප්‍රතීතනය සඳහා වූ ඉල්ලුම්පත්‍රයේ හෝ ඒ ඉල්ලුම්පත්‍රයට අදාළව ඉදිරිපත් කරන ලද වෙනත් යම් ලේඛනයක අසත්‍ය ප්‍රකාශයක් ඇති බවට හෝ යම් වැදගත් විස්තරයක් අත් හැර ඇති බවට,

මණ්ඩලය සෑහීමකට, පත්වන අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි ඒ පරීක්ෂණාගාරයට, සහතිකකරන හෝ පරීක්ෂණ ආයතනයට, පුහුණු කිරීමේ ආයතනයට හෝ තැනැත්තාට ප්‍රදානය කර ඇති ප්‍රතීතනය මණ්ඩලය විසින්, අත්හිටුවීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කළ හැකි අතර අවස්ථාවෝචිත පරිදි ඒ අත්හිටුවීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම පිළිබඳව මණ්ඩලය විසින් ඒ පරීක්ෂණාගාරයට, සහතිකකරන හෝ පරීක්ෂණ ආයතනයට, පුහුණුකිරීමේ ආයතනයට හෝ ඒ තැනැත්තාට දැනුම් දෙනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද අත්හිටුවීමේ හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ නියමයකින් අතෘප්තියට පත් තැනැත්තකු විසින් ඊට විරුද්ධව නියමිත කාලයක් ඇතුළත නියමිත ආකාරයට පාලක සභාව වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය. එකී අභියාචනය පිළිබඳව පාලක සභාවේ තීරණය අවසානාත්මක වන්නේ ය.

මණ්ඩලය විසින් ලේඛනයක් පවත්වාගෙන යා යුතු බව.

**21**. 17 වන වගන්තිය යටතේ ප්‍රතීතන ප්‍රදානය කරනු ලැබුවා වූ පරීක්ෂණාගාර, සහතිකකරන සහ පරීක්ෂණ ආයතන, පුහුණු කිරීමේ ආයතන සහ තැනැත්තන් පිළිබඳව සහ එම පරීක්ෂණාගාර, සහතිකකරන සහ පරීක්ෂණ ආයතන, පුහුණු කිරීමේ ආයතන සහ තැනැත්තන් වෙත කරගෙන යාමට හෝ ඉටු කිරීමට ප්‍රතීතනය ලබා දී ඇති පරීක්ෂණ සහ කටයුතුවල විෂය පථය පිළිබඳව මණ්ඩලය විසින් ලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

## III වන කොටස

## මණ්ඩලයේ කාර්ය මණ්ඩලය

මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා.

**22**. (1) අමාත්‍යවරයා විසින් පාලක සභාව විමසා (මෙම පනතේ "අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන,) විද්‍යා හෝ තාක්ෂණ අංශයේ නිසි සුදුසුකම් ලබා ඇති තැනැත්තකු, මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා ලෙස පත් කළ යුතු ය.

(2) අධ්‍යක්ෂවරයාගේ සේවානියුක්තිය පිළිබඳ නියම සහ කොන්දේසි අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අධ්‍යක්ෂවරයාගේ පාරිශ්‍රමික නිශ්චය කරනු ලැබිය යුතු ය.

(4) රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා සිය ධුරයේ කාර්ය ඉටුකිරීමට අධ්‍යක්ෂවරයා අපොහොසත් වන කවර හෝ අවස්ථාවක දී ඔහු නොපැමිණ සිටින කාලය තුළ දී ඔහුගේ ධුරයේ වැඩ බැලීම සඳහා වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(5) මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අධ්‍යක්ෂවරයාගේ කර්තව්‍ය විය යුත්තේ පාලක සභාව විසින් පිළිපදිනු ලබන ප්‍රතිපත්තිවලට අනුකූලව සහ පාලක සභාවේ විධානයන්ට යටත්ව මණ්ඩලයේ කටයුතු සංවිධානය කිරීම සහ මෙහෙයවීම වේ. ඔහු පාලක සභාවේ ලේකම්වරයා ලෙස ද කටයුතු කළ යුතු ය.

මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් කෙරෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලයට බලය ඇති බව.

**23**. පාලක සභාවට, අධ්‍යක්ෂවරයා හැර මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට සහ (සේවයෙන් පහකිරීම ද ඇතුළත්ව) ඔවුන් විෂයෙහි විනය පාලනය කිරීමට ද බලය තිබිය යුතු ය.

පාලක සභාවේ බලතල පැවරීම.

**24**. (1) (3) වන උපවගන්තියේ විධිවිධානයන්ට යටත්ව මණ්ඩලයේ අනිකුත් නිලධරයන් සහ සේවකයන් පත් කිරීම සහ ඔවුන් සේවයෙන් පහ කිරීමට අදාළ මණ්ඩලයේ සියලුම බලතල හෝ ඉන් කිසිවක් පාලක සභාව විසින් අධ්‍යක්ෂවරයා වෙත පවරා දෙනු ලැබිය හැකි ය. මේ යටතේ අධ්‍යක්ෂවරයා වෙත පවරනු ලැබූ බලතල ක්‍රියාත්මක කිරීමේ දී අධ්‍යක්ෂවරයා විසින් පත්කරනු ලබන සෑම නිලධරයකුගේ ම හෝ සේවකයකුගේ ම පාරිශ්‍රමික ඇතුළු සේවානියුක්තිය පිළිබඳ කොන්දේසි, පාලක සභාවේ එකඟත්වය ඇතිව අධ්‍යක්ෂවරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂවරයා විසින් මණ්ඩලයේ පූර්ව අනුමැතිය ඇතිව මිස ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු මණ්ඩලයේ නිලධරයකු හෝ සේවකයකු වශයෙන් පත් කරනු නොලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ යම් නිලධරයකු හෝ සේවකයකු අධ්‍යක්ෂවරයා විසින් සේවයෙන් පහකිරීම මණ්ඩලයේ පූර්ව අනුමැතිය ඇතිව සිදුකළ යුතු ය.

තක්සේරුකරුවන් පත් කිරීම.

**25**. (1) අධ්‍යක්ෂවරයා විසින් පාලක සභාවේ අනුමැතිය ඇතිව, මේ පනතේ විධිවිධාන යටතේ කිරීමට නියමිත තක්සේරු කිරීම් කිරීමේ කාර්යය සඳහා තක්සේරුකරුවන් ලෙස කටයුතු කිරීමට, මණ්ඩලයේ යම් නිලධරයන් හෝ සේවකයන් නැතහොත් නිසි පරිදි සුදුසුකම් ලැබූ වෙනත් තැනැත්තන් අතුරෙන් තක්සේරු මූල මණ්ඩලයක් පත්කරනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂවරයා විසින් මණ්ඩලයේ අනුමැතිය ඇතිව, යම්කිසි පැවරුමක් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට, තක්සේරු මූල මණ්ඩලයෙන් තක්සේරුකරුවන් තෝරාගැනීම සඳහා, ක්‍රියා පිළිවෙල සකස් කළ යුතු ය.

(3) එසේ තෝරාගත් සෑම තක්සේරුකරුවකුට ම, මේ පනතේ කාර්ය සඳහා තක්සේරුකරුවකු ලෙස තමා පත්කරනු ලැබූ බවට පත්වීමේ ලිපියක් මණ්ඩලය විසින් නිකුත් කළ යුතු ය.

(4) තක්සේරුකරුවකු ලෙස මේ වගන්තියේ විධිවිධානයන්ට අනුව පත්කරනු ලැබ ඇති තැනැත්තකුට ඔහු විසින් සිදු කළ පැවරුම සම්බන්ධව පාලක සභාවේ එකඟත්වය ඇතිව අධ්‍යක්ෂවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි අනුප්‍රමාණ අනුව පාරිශ්‍රමික හෝ දීමනා අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

## IV වන කොටස

## මුදල්

මණ්ඩලයේ අරමුදල.

**26**. (1) මණ්ඩලයට මණ්ඩලයේම අරමුදලක් තිබිය යුතු ය.

(2) මණ්ඩලයේ අරමුදලට පහත දැක්වෙන මුදල් බැර කරනු ලැබිය යුතු ය :—

(අ) මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ;

(ආ) මේ පනත යටතේ මණ්ඩලය විසින් සලසනු ලබන සේවා සම්බන්ධයෙන් මණ්ඩලය වෙත ලැබෙන සියලුම මුදල් ;

(ඈ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත කවර වූ හෝ ප්‍රභවයකින් පරිත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් මණ්ඩලයට ලැබෙන සියලු මුදල් ;

(ඇ) මණ්ඩලයේ යම් නිශ්චල හෝ චංචල දේපළක් විකිණීම මගින් ලැබෙන යම් මුදලක් ද ඇතුළුව මේ පනත යටතේ මණ්ඩලය විසින් ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය ඉටු කිරීමේ දී මණ්ඩලයට ලැබෙන සියලු මුදල්.

(3) මණ්ඩලයේ අරමුදලින් පහත දැක්වෙන මුදල් ගෙවනු ලැබිය යුතු ය :—

(අ) මේ පනත යටතේ මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්යය ඉටු කිරීමේ දී මණ්ඩලය විසින් දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් ;

(ආ) මේ පනතේ යම් විධිවිධානයක් මගින් මණ්ඩලයේ අරමුදලින් ගෙවීමට අවශ්‍ය කරනු ලබන සියලු මුදල් ; සහ

(ඇ) 1958 අංක 15 දරන පනතින් පිහිටුවන ලද සේවක අර්ථසාධක අරමුදල් පනත සහ 1980 අංක 46 දරන පනතින් පිහිටුවන ලද සේවක භාර අරමුදල් පනත යටතේ පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාර අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවීමට අවශ්‍ය කරනු ලබන සියලු මුදල්.

මණ්ඩලයේ අයවැය.

**27**. සෑම මුදල් වර්ෂයක් සඳහා ම අයවැයක් පිළියෙල කිරීම සඳහා මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු අතර එම අයවැය එයට අදාළ වන මුදල් වර්ෂය ආරම්භ වීමට මාස තුනකට පෙර පාලක සභාව විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

ලබාදෙන ලද සේවා සඳහා ගාස්තු අය කිරීම.

**28**. 39 වන වගන්තිය යටතේ සාදන ලද යම් නියෝගවල විධිවිධානවලට යටත්ව, මේ පනත යටතේ මණ්ඩලය විසින් ලබාදෙන ලද යම් සේවාවක් සම්බන්ධයෙන්, නියම කරනු ලැබිය හැකි ගාස්තු කිසිවක් මණ්ඩලය විසින් අයකරනු ලැබිය හැකි වන්නේ ය.

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය.

**29**. (1) මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) මණ්ඩලයේ ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තබාගැනීමට පාලක සභාව විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන්, රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය පිළිබඳව අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ විය යුතු ය.

(4) 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මණ්ඩලයට සහ මණ්ඩලය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන අනුව නිසි කාලය තුළ දී අවසන් ගිණුම් සහ වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීමට පාලක සභාව වගබලාගත යුතු ය.

## V වන කොටස

## පොදු විධිවිධාන

රහස්‍යභාවය.

**30**. පාලක සභාවේ හෝ එහි යම් කමිටුවක සෑම සාමාජිකයකුම හෝ මණ්ඩලයේ සෑම නිලධරයකුම හා සේවකයකුම විසින් සහ මේ පනත යටතේ පත් කරනු ලබන සෑම තක්සේරුකරුවකුම විසින් තම කාර්ය ආරම්භ කිරීමට ප්‍රථම –

(අ) එසේ කිරීමට අධිකරණයක් මගින් නියම කරනු ලැබ ඇති විට ; හෝ

(ආ) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානයකට අනුකූලව ක්‍රියා කිරීම සඳහා, හෝ

හැර, මේ පනත යටතේ සිය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය ඉටු කිරීමේ දී තමාට දැනගැනීමට ලැබුණු යම් කරුණක් හෙළිනොකරන බවට පොරොන්දු වෙමින් ප්‍රකාශයක් අත්සන් කළ යුතු ය.

පාලක සභාවේ සහ මණ්ඩලයේ සාමාජිකයන්.

**31**. පාලක සභාවේ සියලුම සාමාජිකයන් ද, මණ්ඩලයේ සියලුම නිලධරයන් සහ සේවකයන් ද මේ පනත යටතේ පත්කරනු ලබන සියලු තක්සේරුකරුවන් ද දණ්ඩ නීති සංග්‍රහයේ කාර්ය සඳහා සහ එහි අර්ථානුකූලව රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

මණ්ඩලය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් විය යුතු බව.

**32**. අල්ලස් පනතේ අර්ථානුකූලව මණ්ඩලය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම්ගත යුතු ය.

**33**. (1) (අ) මේ පනත යටතේ මණ්ඩලය විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සඳහා මණ්ඩලයට විරුද්ධව ; හෝ

මේ පනත යටතේ කරන ලද ක්‍රියා සඳහා ආරක්ෂාව.

(ආ) පාලක සභාවේ යම් සාමාජිකයකු හෝ මණ්ඩලයේ යම් නිලධරයකු හෝ සේවකයකු හෝ එහි කමිටුවක සාමාජිකයකු හෝ මේ පනත යටතේ පත් කරන ලද යම් තක්සේරුකරුවකු හෝ විසින් මේ පනත යටතේ හෝ පාලක සභාවේ හෝ මණ්ඩලයේ විධානය මත සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, ඒ සාමාජිකයාට, නිලධරයාට, සේවකයාට, කමිටුවේ සාමාජිකයාට හෝ තක්සේරුකරුට විරුද්ධව,

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) යම් අධිකරණයක දී මණ්ඩලය විසින් හෝ පාලක සභාව විසින් හෝ මණ්ඩලයට එරෙහිව හෝ පාලක සභාවට එරෙහිව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලය විසින් හෝ පාලක සභාව විසින් දරන ලද යම් වියදමක් මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලයට හෝ පාලක සභාවට ගෙවනු ලැබූ හෝ මණ්ඩලය විසින් හෝ පාලක සභාව විසින් අයකරගනු ලැබූ යම් නඩු ගාස්තුවක් මණ්ඩලයේ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ හෝ පාලක සභාවේ හෝ මණ්ඩලයේ විධානය මත (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව පවරා ඇති යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී එම තැනැත්තා විසින් දරන ලද යම් වියදමක් එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අයකරගනු ලැබුවේ නම් මිස, එම ක්‍රියාව සද්භාවයෙන් කරනු ලැබූ බවට අධිකරණය විසින් තීරණය කරනු ලබන්නේ නම් එම වියදම මණ්ඩලයේ අරමුදලින් ඔහුට ගෙවනු ලැබිය යුතු ය.

**34**. මණ්ඩලය විසින් ලිඛිතව බලය පවරනු ලැබූ, යම් නිලධරයකු හෝ මේ පනත යටතේ පත් කරනු ලැබූ තක්සේරුකරුවකු හෝ විසින්, 17 වන වගන්තිය යටතේ ප්‍රතීතනය ප්‍රදානය කරනු ලැබූ යම් තැනැත්තකු ගේ ලියාපදිංචි ව්‍යාපාරික ස්ථානයට ඇතුළු වී—

ඇතුළුවීමේ බලතල.

(අ) ප්‍රතීතනය සඳහා වූ නිර්නායක සපුරා ඇත් ද යන්න දැන ගැනීමේ කාර්ය සඳහා අවශ්‍ය වන තාක් දුරට එම ව්‍යාපාරය පිළිබඳ පරීක්ෂණ සහ විමර්ශන පවත්වනු ලැබිය හැකි ය ;

(ආ) මේ පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝග වලට ද 18 වන වගන්තිය යටතේ තමා වෙත නිකුත් කර ඇති සහතිකයේ නියමයන්ට ද අනුකූලව ක්‍රියා කරන්නේ ද යන්න දැන ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු හෝ වාර්තා ඉදිරිපත් කරන ලෙස එම තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

පනත මගින් මණ්ඩලය වෙත පවරා ඇති යම් නාමයක් භාවිත කිරීම තහනම් කිරීම.

**35**. 36 වන වගන්තියේ (2) සහ (3) උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, මේ පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය මගින් මණ්ඩලයට ලබා දී ඇති යම් නාමයක් යටතේ හෝ එහි උපනාමයක් යටතේ කිසිම තැනැත්තකු විසින් යම් කටයුත්තක්, ව්‍යාපාරයක්, වෙළෙඳාමක් හෝ රැකියාවක් පවත්වාගෙන නොයා යුතු ය.

"අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය" හෝ "ප්‍රතීතනය" යන වචන භාවිත කිරීම සීමා කිරීම.

**36**. (1) අමාත්‍යවරයාගේ ලිඛිත අනුමැතිය ඇතිව මිස සහ (2) වන හා (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව හැර—

(අ) "අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය" යන වචන හෝ මණ්ඩලය විසින් භාවිත කරන වෙනත් යම් නාමයක් හෝ උපනාමයක් හෝ ඇතුළත් කිසිම වෙළෙඳ ලකුණක්, උපක්‍රමයක්, වෙළෙඳ නාමයක්, ශීර්ෂයක්, ලේබලයක්, ප්‍රවේශ පත්‍රයක්, පින්තූර මගින් දක්වන නිරූපණයක්, නමක්, අත්සනක්, අකුරක්, අංකයක් හෝ ඒ කිසිවක එකතුවක් 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පනත යටතේ ලියාපදිංචි කරනු නොලැබිය යුතු ය ;

(ආ) 17 වන වගන්තිය යටතේ ප්‍රතීතනය ප්‍රදානය කරනු ලැබ ඇත්නම් මිස කිසිම තැනැත්තකු විසින් ප්‍රතීතනය යන වචනය ඇතුළත් සලකුණක් යටතේ හෝ ඒ තැනැත්තාට 17 වන වගන්තිය යටතේ ප්‍රතීතනය ප්‍රදානය කර ඇති බව හැඟවෙන යම් ආකාරයකින් ඒ වචනය භාවිත කර ඇති විස්තරයක් යටතේ හෝ යම් භාණ්ඩයක් හෝ නිෂ්පාදනයක් විකිණීම හෝ යම් සේවයක් හෝ පහසුකමක් පිරිනැමීම හෝ නොකළ යුතු ය.

(2) මේ පනත ආරම්භ වූ දිනයේ දී 35 වන උපවගන්තියේ සඳහන් නාමයක් යටතේ යම් කටයුත්තක්, ව්‍යාපාරයක්, වෙළෙඳාමක් හෝ රැකියාවක් කරගෙන යනු ලබන හෝ එවැනි යම් නාමයක් යටතේ

ලියාපදිංචි වී ඇති යම් තැනැත්තකු විසින් 35 වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද එම නාමය යටතේ අවස්ථාවෝචිත පරිදි එම කටයුත්ත, ව්‍යාපාරය, වෙළෙඳාම හෝ රැකියාව දිගටම පවත්වාගෙන යාම හෝ එවැනි යම් නාමයක් යටතේ දිගටම ලියාපදිංචිවීම කළ හැකි ය.

(3) මේ පනත ආරම්භවන දිනයේ දී ලියාපදිංචි කර තිබූ යම් වෙළෙඳ සලකුණකට හෝ එකී වෙළෙඳ සලකුණ යටතේ යම් භාණ්ඩයක් හෝ නිෂ්පාදනයක් විකිණීම සම්බන්ධයෙන් හෝ (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල හෝ විධිවිධාන බල නොපෑ යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ දී ඇති අනුමතය අනිසි ලෙස ප්‍රයෝජනයට ගැනීම වැළැක්වීම සඳහා එසේ කළ යුතු බව අමාත්‍යවරයා ගේ මතය වන්නේ නම්, එකී අනුමතය කවර හෝ වේලාවක ඉල්ලා අස්කර ගැනීම ඔහු විසින් කළහැකි වන්නේ ය.

**37**. (අ) 18 (3) වගන්තියේ විධිවිධාන උල්ලංඝණය කරන ; වැරදි.

(ආ) 30 වන වගන්තියේ හෝ 35 වන වගන්තියේ හෝ 36 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේදවල හෝ විධිවිධාන උල්ලංඝණය කරන ;

(ඇ) පනත මගින් තමා වෙත පවරා දී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී පාලක සභාවේ හෝ මණ්ඩලයේ යම් නිලධරයකුට හෝ මේ පනත යටතේ පත්කරනු ලැබූ තක්සේරුකරුවකුට ප්‍රතිරෝධය පාන හෝ බාධා කරන ;

(ඈ) 34 වන වගන්තිය යටතේ තමා විසින් ඉදිරිපත් කරනු ලබන යම් වාර්තාවක හෝ තොරතුරක සිතාමතාම සාවද්‍ය ප්‍රකාශයක් කරන නැතහොත් යම් වැදගත් තොරතුරක් සඳහන් නොකර සිටින,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

**38**. (1) වෙනත් යම් නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුවද මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව මේ පනත යටතේ වූ වරදක් සඳහා වරදකරුවන යම් තැනැත්තකු— දණ්ඩන.

(අ) 37 වන වගන්තියේ (අ) හෝ (ඇ) හෝ (ඈ) ඡේදවල සඳහන් වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල් දසදහසකට නොඅඩු සහ රුපියල් පන්ලක්ෂයකට නොවැඩි දඩයකට ; සහ

(ආ) 37 වන වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දෙලක්ෂ පනස්දහසකට නොවැඩි දඩයකට ද,

යටත් විය යුතු ය.

(2) 37 වන වගන්තියේ සඳහන් වරදකට යම් තැනැත්තකු වරදකරු කරනු ලබන අවස්ථාවක දී එම වරද සඳහා අධිකරණය විසින් පනවනු ලබන වෙනත් යම් දණ්ඩනයකට අතිරේකව වරද සිදු කරනු ලැබුවේ යම් භාණ්ඩ සම්බන්ධයෙන් ද එම භාණ්ඩ සියල්ලම හෝ ඉන් යම් කොටසක් අධිකරණය විසින් රාජසන්තක කළයුතු බවට සහ එසේ රාජසන්තක කිරීමට නියම කරනු ලැබූ භාණ්ඩ අධිකරණය විසින් විධාන කරනු ලබන ආකාරයට බැහැර කරනු ලැබිය යුතු බවට ද නියම කරනු ලැබිය හැකි ය.

පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි.

**39**. මේ පනත යටතේ වූ යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදුකරනු ලබන අවස්ථාවක දී—

(අ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම් එම වරද සිදු කරනු ලැබූ අවස්ථාවේ දී එම සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු වූ සෑම තැනැත්තකුම ; සහ

(ආ) එම පුද්ගල මණ්ඩලය වෙළෙඳ සමාගමක් නම් එම වරද සිදු කරනු ලැබූ අවස්ථාවේ දී එම සමාගමේ කොටස්කරුවකු වූ සෑම තැනැත්තකුම,

එම වරද සිදු කරනු ලැබුවේ තමාගේ දැනුම නොමැති බවට හෝ එම වරද සිදු කිරීම වැළැක්වීම සඳහා තමා නිසි උද්යෝගයකින් කටයුතු කළ බවට එම තැනැත්තා ඔප්පු කරන්නේ නම් මිස ඔහු එම වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

නියෝග.

**40**. (1) නියෝග සෑදීමට මේ පනත මගින් බලය පැවරී ඇති හෝ නියම කර ඇති හෝ මේ පනත මගින් නියමිත යයි නියම කර ඇති සියලු කරුණු සම්බන්ධයෙන් පාලක සභාවේ නිර්දේශ මත අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලැබූ දින සිට හෝ එම ගැසට් පත්‍රයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක්ම අනනුමතයේ දින සිට එහෙත් එය යටතේ කරන ලද කිසිවක වලංගු භාවයට හානියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**41**. 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් පරීක්ෂණ පර්යේෂණාගාර සඳහා වූ ප්‍රතීතන ක්‍රමය යටතේ ප්‍රදානය කරන ලද සහ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පැවැති යම් ප්‍රතීතනයක් මේ පනත ක්‍රියාත්මක වන දින සිට මාස හයක් සඳහා වලංගුව සහ ක්‍රියාත්මක ව පවතින්නේ ය.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ප්‍රදානය කරන ලද ප්‍රතීතනය මාස හයක කාලයක් සඳහා වලංගු බව.

**42**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**43**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

අර්ථ නිරූපණය.

"ප්‍රතීතනය" යන්නෙන්, අවස්ථාවෝචිත පරිදි අනුකූලතා තක්සේරු කරගෙන යාමට නියමිත පරීක්ෂණාගාරයක්, සහතිකකරන හෝ පරීක්ෂණ ආයතනයක්, පුහුණු කිරීමේ ආයතනයක් හෝ තැනැත්තෙක් සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ සහතිකයේ නිශ්චිතව දක්වා ඇති පරීක්ෂණ සහ කටයුතු ඉටු කිරීමට හෝ ක්‍රියාත්මක කිරීමට එම පරීක්ෂණාගාරය, සහතිකකරන හෝ පරීක්ෂණ ආයතනය, පුහුණු කිරීමේ ආයතනය හෝ තැනැත්තා ප්‍රවීන බවට මණ්ඩලය විසින් පිළිගැනීම අදහස් කෙරේ ;

"ප්‍රතීතන ලකුණ" යන්නෙන්, මේ පනත යටතේ නියෝග මගින් නියමිත ලකුණක් අදහස් වේ ;

"සහතික" යන්නෙන්, 18 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන ප්‍රතීතන සහතිකයක් අදහස් වේ ;

"අනුකූලතා තක්සේරුව" යන්නෙන්, යම් සැකසීමක්, ක්‍රමයක්, භාණ්ඩයක්, නිෂ්පාදනයක් හෝ සේවාවක් සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක් මගින් හෝ එය යටතේ නිශ්චිතව දක්වනු ලබන (නිපදවීමකට, නිෂ්පාදනයකට, සැකසීමකට හෝ පිරියම් කිරීමකට අදාළ නියමයන් ද ඇතුළුව) ප්‍රමිතීන්ට සහ වෙනත් තාක්ෂණික නියමයන්ට එම සැකසීම, ක්‍රමය, භාණ්ඩය, නිෂ්පාදනය හෝ සේවාව අනුකූල වන බවට කෙලින්ම හෝ අන්‍යාකාරයකින් තීරණය කිරීම අදහස් වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, මහනගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි යම් සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන හෝ ඉටු කරනු ලබන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූපී වන හෝ සමාන වන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ ඇතිකරන ලද හෝ පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ ;

"තැනැත්තා" යන්නට, පුද්ගල මණ්ඩලයක් ද ඇතුළත් වේ ;

"නියමිත" යන්නෙන්, මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියම කිරීම අදහස් වේ ;

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය යටතේ පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.